ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය) -2021
-----------------------------------------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යයක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාලපරිච්ඡේදය තුළ අත්පත් කරගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම, එම වටිනාකමින් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මඟින් ලබාගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම සහ අධිකාරියේ මුදලින් ගෙවීම් කරන ලද වටිනාකම යන විස්තර සටහන් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගත් රු.4,384,829 ක වත්කම් සම්බන්ධව මෙකී තොරතුරු අනාවරණය කර නොතිබුණි. | 2022 අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව වත්කම්වල සාධාරණ වටිනාකම එහි පවත්නා පොත් අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට එම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද රු.245,047 ක නාමික වටිනාකමක් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කෘෂිකාර්මික උපකරණ තවදුරටත් භාවිතා කරමින් පැවතිය ද, එම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ඒවායෙහි සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එම ප්‍රත්‍යාගණන කාර්යය 2022 මාර්තු 25 දින අවසන් කර ප්‍රත්‍යාගණන අගයන් අධිකාරිය වෙත ලැබී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 28 ඡේදය අනුව භාණ්ඩ විකිණීමෙන් වන අයභාර හඳුනා ගැනීම සඳහා අස්ථිත්වය විසින් | ඉදිරියේ දී අලෙවි කරන ලද පැළ සම්බන්ධයෙන් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව |

| | | |
|---|---|---|
| භාණ්ඩවල අයිතියේ අවදානම් හා ප්‍රතිලාභ මිලදී ගන්නාට පවරා තිබිය යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට පාරිභෝගිකයන් වෙත සපයා නොතිබුණු රු.1,417,200 ක ගොවිපළ නිෂ්පාදන වටිනාකමක් ණයට විකුණුම් අදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම එම ප්‍රමාණයට වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙවැනි ගැටලු ඇති නොවීමට වගබලා ගන්නා බව. | කටයුතු කළ යුතුය. |

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත්ව තිබුණු ගිණුම් ශේෂ 2 ක් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන ඒමේදී ඒවායේ අගය රු.1,144,056 ක් වැඩියෙන් ලෙජරයට පිටපත් කර තිබුණු නමුත් මෙම වෙනසට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | 2022 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉකුත් වර්ෂයේ විගණිත ගිණුම් ශේෂ නිවැරදිව ඉදිරියට ගෙන යා යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව, අධිකාරිය ගෙවිය යුතු ශේෂය ලෙස රු.54,911,756 ක් දක්වා තිබුණද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ඊට අනුරූපී ගෙවිය යුතු ශේෂයක් දක්වා නොතිබුණි. එසේ වුවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අධිකාරියට ලැබිය යුතු ශේෂයක් ලෙස රු.2,094,280 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, එම ශේෂය 1998 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. මෙම පරස්පර තත්ත්වය පිළිබඳ සොයා බලා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තත්ත්වය පෙන්නුම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අයවිය යුතු රු.2,094,280 ක මුදල පොත්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ ලැබී ඇති බව සහ එම කොමිෂන් සභාවට ගෙවිය යුතු රු.54,911,756 ක මුදල කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ගෙවීම් කරන බව. | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට | අවශ්‍ය ක්‍රියාමාර්ග | හිඟ මුදල් අයකර |

| | | | |
|---|---|---|---|
| | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.20,444,454 ක් වූ අතර ඉන් රු.16,807,719 ක් වසරක් ඉක්මවූ ලැබිය යුතු ශේෂ විය. | ගෙන ඇති බව. | ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සතුව පැවති අලෙවි අංශයට සැපයුම්කරුවන් විසින් 2014 සහ 2015 වර්ෂවලදී සපයන ලද භාණ්ඩ වෙනුවෙන් වංචනික ලෙස දෙවරක් මුදල් ගෙවා තිබීම සම්බන්ධයෙන් කරන ලද විධිමත් විනය පරීක්ෂණයේ නිර්දේශ වාර්තාව අනුව නිලධාරීන්ගෙන් අය කරගත යුතු මුදල රු.2,116,410 ක් විය. ඉන් රු.844,251 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබුණු අතර රු.1,272,159 ක මුදලක් තවදුරටත් අයකරගත යුතුව පැවතුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ 09 ක එකතුව රු.9,866,005 ක් වූ අතර, ඉන් රු.1,152,732 ක් වසරක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂ විය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු ශේෂ නිරාකරණය කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3(ආ) මාර්ගෝපදේශය | රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සැපයුම් සඳහා වූ ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹීම අවශ්‍ය වුවද එම සීමාව ඉක්මවූ සැපයුම් රු.832,065 ක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | සැපයුම්කරුවන් විසින් වගකීම් කාලයක් ලබාදී තිබුණු බැවින් ගිවිසුම්ගත නොවූ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධාරීන් | නියමකර තිබෙන විධිවිධාන අනුව පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරාගෙන පත්වීම් ලබාදිය යුතු | පිළිතුරු සපයා නැත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගැනීම් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | බඳවාගැනීම සඳහා වූ පරිපාටියේ 5.3(ii) ඡේදය | වුවද, පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගෙන පළමු ප්‍රමුඛතාවයේ සිට 4 වන ප්‍රමුඛතාවය දක්වා වූ ප්‍රමුඛතා ලැබූ අයදුම්කරුවන් හතරදෙනාට පත්වීම් ලබා නොදී ප්‍රමුඛතාවය 7, 14 සහ 18 (18 යටතේ අයදුම්කරුවන් දෙදෙනෙක් ඇත.) ලබා සිටි අයදුම්කරුවන් 4 දෙනාට පත්වීම් ලබාදී තිබුණි. මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබුණු කුසලතා පිළිවෙළ නොසලකා පත්වීම් ලබාදී තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කලාප නිලධාරීන් බඳවාගැනීම සඳහා වූ පරිපාටියේ 4.3.3(1) ඡේදය | නියමකර තිබෙන විධිවිධාන අනුව පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරාගෙන පත්වීම් ලබාදිය යුතු වුවද පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවලදී ඉහළම ලකුණු ලබාගෙන පළමු ප්‍රමුඛතාවය හිමිකරගත් අයදුම්කරුට ලබානොදී 6 වන ප්‍රමුඛතාවය ලබාගත් අයදුම්කරුට කලාප නිලධාරී පත්වීම ලබාදී තිබුණි. මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබුණු කුසලතා පිළිවෙළ නොසලකා පත්වීම් ලබාදී තිබුණි. | පිළිතුරු සපයා නැත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගැනීම් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 188(2) | ගනුදෙනුකරුවන් විසින් සෘජුවම බැංකු ගිණුමට බැර කරන ලද මුදල්වලට අදාළ ගනුදෙනු හඳුනාගැනීමටත් ඒ අනුව ගිණුම් තැබීමටත් කටයුතු කළ යුතු වුවද අවස්ථා 80 කදී බැංකු ගිණුම් දෙකක එසේ තැන්පත් කරන ලද රු.625,340 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කඩිනමින් නිවැරදි කරන බව. | බැංකු ගිණුමට සෘජුවම බැරකරන ලද මුදල් හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වුවද එවැනි චෙක්පත් 163 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම චෙක්පත්වලින් රු.1,229,966 කට අදාළ චෙක්පත් 147 ක් 2020 සහ ඊට පෙර වර්ෂවලට අයත් ඒවා විය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,878,424 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,059,573 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,818,851 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රතිපාදන රු.72,534,000 ක් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පල්ලේකැලේ ගොවිපළ රු.1,412,013 ක්ද, කොත්මලේ ගොවිපළ රු.3,130,475 ක්ද අලාභ ලබා තිබුණි. විකුණුම් ආදායම ඉක්මවා මෙහෙයුම් වියදම් ඉහළ යාම මෙසේ ගොවිපළ අලාභ ලැබීමට හේතු වී තිබුණි. | දක්වා තිබෙන තොරතුරු සමඟ එකඟ වන බව. | ආදායම් සහ වියදම් සැලසුම්ගතව කළමනාකරණය කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වසරේදී කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ලබාදීමට මිලදී ගන්නා ලද උදළුතලයක්, මුල්ලුවක්, සවලක්, මල් බාල්දියක් සහ රේක්කයක් ඇතුළත් රු.7,516,260 ක කෘෂි උපකරණ කට්ටල 1860 ක් 2022 ජනවාරි 25 වන විටද, ප්‍රතිලාභීන් වෙත ලබානොදී ගබඩාවේ රඳවාගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී පවුල් 10680 කට එම උපකරණ ලබාදීම සඳහා මිලදීගත් රු.19,951,656 ක් වටිනා කෘෂි උපකරණද 2022 ජනවාරි 25 වන විටත් ගබඩාවේ රඳවා තිබුණි. එම කෘෂි උපකරණ අතර උදළුතල 2670 ක් උදළු මුල්ලු 6102 ක් සවල් 6102 ක් සහ මල් බාල්දි 5929 ක් ද තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ක්‍රියාකාරී සැලස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කුණ්ඩසාලේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.4,464,521 ක් වැය කර 2017 වර්ෂයේදී ඉදිකරන ලද අලෙවි ගොඩනැගිල්ල සඳහා ජලය සහ විදුලිය ආදී පහසුකම් ලබාගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අවසර ලබාදී නොතිබුණු අතර භාවිතයට ගැනීම සඳහා ද විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙන බැවින් එම ගොඩනැගිල්ල අභාවිතව පැවතුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ යම් එකඟතාවයකට පැමිණ, මෙම ගොඩනැගිල්ල ආදායම් උත්පාදන ක්‍රමවේදයක් සඳහා යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව සාකච්ඡා කරන ලද අතර ඒ අනුව මේ පිළිබඳ ලිඛිත ඉල්ලීමක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇති බව. | රජයේ මුදල් භාවිතා කර ඉදිකරන ලද ගොඩනැගිල්ල ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියට අයත් රු.1,000,000 ක කැබ් රථයක් සහ රු.195,000 ක අත්ට්‍රැක්ටරයක් වසර 3 ක කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ කළ නොහැකි නම් වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | ආයතනය සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

3.4 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගන්නෝරුවේ පිහිටි අධිකාරියේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල සහ ඉඩම, අක්කර 5 ක කොත්මලේ හා අක්කර 10 ක පල්ලේකැලේ ගොවිපල් පිහිටි රජයේ ඉඩම් අධිකාරියට පවරා නොගෙන භාවිතා කරමින් තිබුණි. | විධිමත්ව අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණු ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, පල්ලේකැලේ සහ කොත්මලේ ගොවිපළ අධිකාරිය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව. | අධිකාරිය විසින් භාවිතා කරනු ලබන මෙම වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 71 අනුව ගොවිපලවල් සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් ස්ථාපිත නොකර හදබිම අධිකාරියට අනුමත වූ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකු යොදා ගෙන ගොවිපලේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. | පිළිගෙන ඇත. | අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.3 ඡේදය අනුව වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් 2019 සහ 2020 වර්ෂ සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | ඉදිරියේ දී නියමිත කාලය තුළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | ----------------------- | ------------- |
| කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා විසින් 1978 පෙබරවාරි 01 දින අංක 302/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය අනුව අධිකාරිය විසින් උපරිම ඵලදාව සහ පරිසරය සුරැකෙන පරිදි ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය කිරීමට පියවර ගත යුතු වුවද, පසුගිය වසර කිහිපයක ක්‍රියාකාරකම් අනුව ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අධිකාරිය වෙත ලැබී තිබුණු මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය අනුව මෙම කාර්යයන් සැලසුම් කළ බව. | අධිකාරිය වෙත පැවරී තිබෙන වගකීම් ඉටුකිරීම සඳහා සැලසුම්ගතව කටයුතු කළ යුතුය. |